00028

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන- හයවන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2019

අන්තර්කරණ අධ්‍යාපනය - STU6318/ESU4118

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.18 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගත් ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. දුබලතාවය යන සංකල්පය එක් (01) නිදසුනක් යොදාගෙන පැහැදිලි කරන්න.

02. විශේෂ අධ්‍යාපනය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

03. විශේෂ අධ්‍යාපන සේවාවන් අවශ්‍ය ළමයින් කාණ්ඩ පහක් (05) නම් කරන්න.

04. ඩවුන් සින්ඩ්‍රෝම් තත්වය සහිත දරුවන්ගේ දැකිය හැකි ශාරීරික ලක්ෂණ පහක් (05) නම් කරන්න.

05. දෘෂ්ටි ඌනතාව සහිත දරුවකුගේ විද්‍යාමාන වන චර්යාමය ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

06. ශ්‍රවණ ඌනතා සහිත දරුවන්ට පැහැදිලිව ශ්‍රවණය කිරීමේ හා අවබෝධ කර ගැනීමේ අපහසුතා ඇති වන අවස්ථා පහක් (05) ලැයිස්තු ගත කරන්න

07. මිනිස් ස්වරාලය තුල උපදින හඩ, කථන ඉන්ද්‍රිය මෙහෙය වීමෙන් අවශ්‍ය ශබ්ද බවට පත් වේ. ඒ සඳහා භාවිතා වන කථන ඉන්ද්‍රියයන් පහක් (05) නම් කරන්න.

08. ඉගෙනුමට ඇති බාධා සඳහා බලපාන පරිසරාත්මක සාධක පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 5 X 8 = 40)

## 2 වන කොටස

09. (i) අන්තර්කරණ අධ්‍යාපනයේ මූලධර්ම තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

(ii) සාර්ථක අන්තර්කරණයක් සඳහා අනුගමනය කලයුතු ක්‍රියා පිලිවෙත් හතක් (07) පැහැදිලි කරන්න.

10. (i) අන්තර්කරණ අධ්‍යාපනයේ ප්‍රතිලාභ පහක් (05) විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) අන්තර්කරණ පංති කාමරයක උගන්වන ගුරුවරයකු සතුවිය යුතු නිපුණතා පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) අන්තර්කරණ පංතිකාමරයක් තුල සිටින විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ සහභාගිත්වය දිරිමත් කිරීමට නාට්‍ය හා රංගකලාව හදාරන ගුරුවරුන්ට ගත හැකි පියවර පහක් (05) ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) අවධාන ඌණතා අධික්‍රියාකාරී අක්‍රමතාවය (ADHD) සහිත සිසුන්ගේ අවධානය රඳවා ගැනීමට බාධාකරන තත්ත්වයන් අවම කිරීමට ගුරුවරයකු විසින් පංති කාමරය තුල ගත හැකි ක්‍රියාමාර්ග පහක් (05) විස්තර කරන්න.

(ලකුණු 10)

12. (i) ඔටිසම් (මනෝ වික්ෂිප්තතාවය) සහිත දරුවන්ගේ දැකිය හැකි ගති ලක්ෂණ පහක් (05) උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

(ii) පංතිකාමරය තුල සිටින ඔටිසම් තත්ත්වය සහිත දරුවකුට ඉගැන්වීමේ දී ගුරුවරයකු ලෙස ගත හැකි පියවර පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

13. **(i)** ඉගෙනුම් දුබලතාව සහිත දරුවන්ගේ දැකිය හැකි ලිවීමේ ගැටලු **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

**(ii)** ඉගෙනුම් දුබලතාව සහිත දරුවන්ගේ දැකිය හැකි කියවීමේ ගැටලු **පහක් (05)** දක්වන්න. (ලකුණු 05)

**(iii)** නාට්‍ය හා රංගකලා ගුරුවරයකු ලෙස ඉගෙනුම් දුබලතා සහිත දරුවකුගේ ලිවීමේ හා කියවීමේ කුසලතා වර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් භාවිතා කළ හැකි ආකාර **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 10)

14. **(i)** සුහග හා සහජ දක්ෂතා ඇති දරුවකුගේ දැකිය හැකි නිර්මාණාත්මක දක්ෂතා **පහක් (05)** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

**(ii)** සුහග හා සහජ දක්ෂතා ඇති දරුවන්ගේ නිර්මාණාත්මක දක්ෂතා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී භාවිතා කර ගැනීමට නාට්‍ය හා රංග කලා ගුරුවරයකු ලෙස ඔබට මැදිහත් විය හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.